Chapter III
Article 11

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2019-09-19 |

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | ඩබ්ලිව්.එම්.ටී.එන්. වන්නිනායක මයා,<br>අංක. 489, කජුවත්ත,<br>රුහුණුගම, අරලගංවිල. |
| වගඋත්තරකාර පාර්ශවයවන් | : | 01. පී.ඩී. ගුණරත්න මයා,<br>විදුහල්පති,<br>පො/දිඹු විලයාය මධ්‍ය මහා විද්‍යාලය,<br>අරලගංවිල. |
| | | 02. ආර්.ඩී.සී. ඩයස් මයා,<br>උපගුරු,<br>පො/දිඹු විලයාය මධ්‍ය මහා විද්‍යාලය,<br>අරලගංවිල. |
| | | 03. ඉන්දික කුමාර මයා,<br>උපගුරු,<br>පො/දිඹු විලයාය මධ්‍ය මහා විද්‍යාලය,<br>අරලගංවිල. |

**පැමිණිලි අංකය : HRC/AP/01/13**

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින්, තම පුතා වන උමේෂ ආශක්ත බණ්ඩාර යන අය පො/දිඹු විලයාය මධ්‍ය මහා විද්‍යාලයේ 13 වසරේ ගණිත අංශයේ ඉගෙනුම ලබන බවත්, 2012.12.05 දින පාසල පිරිසිදු කිරීම සිදු කිරිමේදි ඇති වු ප්‍රශ්නයකදි චමින්ද ඩයස් නැමති ගුරුවරයා තම පුතා ඇතුළු සියළු දෙනාට කෝටුවකින් පහරදී ඇති බවත්, තම පුතා නිර්දෝෂිභාවය




| | | | | | |
|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.<br>14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.<br>14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති<br>தவிசாளர்<br>Chairperson | 011-2505451 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2505541 / 74 |
| ඊමේල්<br>மின்னஞ்சல்<br>E-mail | sechrc@gmail.com | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2505521 | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94-11-2505580 / 81 / 82 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk | | |

ඔප්පු කිරීමට යාමේදි ඩයස් නැමති ගුරුභවතා නැවත වතාවක් පුතාට පහරදි ඇති බවත්, ඉන්පසු මෙම ගුරුවරයා මේ බව විදුහල්පතිවරයාට පැමිණිලි කිරීමෙන් පසු විදුහල්පතිවරයා තම පුතා විදුහල්පතිගේ කාමරයට කැඳවා කිසිදු කරුණක් නොවිමසා කිහිප වරක් කණට පහරදී ඇති බවත්, එම ස්ථානයේ සිටි ඉන්දික ඉඩමේගෙදර යන ගුරුවරයාද කණට පහරදී ඇති බවත්, එම පහරදීම හේතුවෙන් තම පුතා අසනීප වී ඇති බවත් සඳහන් කර ඇත. වගඋත්තරකරුවන්ගේ මෙකී ක්‍රියාව හේතුවෙන් තම දරුවාගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුව ඇති බවත් සඳහන් කර ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් වගඋත්තරකාර විදුහල්පතිවරයා 2013.03.05 දිනැති වාර්තාව මඟින් කොමිෂන් සභාව වෙත කරුණු ඉදිරිපත් කරමින් දන්වා ඇත්තේ, 13 වසර විද්‍යා පන්තිය භාර ගුරුතුමා වන ආර්.ඩී.සි.එස්. ඩයස් මහතා විසින් එම ගුරුභවතාට සිසුවකු බැණවැදි පහරදීමට උත්සාහ කළ බව දැනුම් දීමක් කළ බවත්, ඒ අනුව සිසුවා තමන් වෙත කැඳවා තොරතුරු අසාදැනගෙන මෙම සිසුවාට පෙර වැරදිද ඇති බව දැන ගැනීමෙන් පසු මව්පියන් කැඳවන ලෙස නියෝජ්‍ය විදුහල්පතිවරයාට උපදෙස් දුන් බවත්, ඒ අනුව දරුවාගේ මව පාසලට පැමිණීමෙන් පසු මේ පිළිබඳව අවවාද කර, සිද්ධිය විනය කමිටුවට දන්වා පාසලින් අස්කරන බව දැන්වූ බවත් , කිසිදු අවස්ථාවක මෙම දරුවාට පහරදීමක් සිදුකර නොමැති බවත්, මෙම සිද්ධිය සම්බන්ධයෙන් අරලගංවිල පොලිසිය විසින් ගරු අධිකරණයේ නඩුවක් පවරා ඇති බවත්ය.

වගඋත්තරකාර උපගුරු ආර්.ඩී.සි.ඩයස් මහතා කොමිසම වෙත 2013.01.12 දින වාර්තාවක් යොමු කරමින් දන්වා ඇත්තේ, 2012.12.05 වන දින තමන් පන්ති භාරකාරත්වය දරණ 13 විද්‍යා,ගණිත පන්තියට ගොස් පිරිසිදු කිරීමේ කටයුතු සුපුරුදු පරිදි නිරීක්ෂණය කළ බවත්, ඒ වන විට තැන තැන පෙර දිනයේ ආහාර ගෙනා කොල වැටී තිබුණු බවත්, එබැවින් පන්තිය පිරිසිදු කරන ලෙස සිසුන්ට දන්වා පිටව ගිය බවත්ය.

පාසල් නිවාඩු වාරය ආරම්භ වීමට පෙර පාසල් භූමිය පිරිසිදු කළයුතු බවට විදුහල්පතිවරයාගෙන් උපදෙස් ලද බවත්, ඒ අනුව 12-13 ශ්‍රේණිවල සිසුන් අදාළ කාර්ය සඳහා යෙදවූ බවත්, නමුත් 13 ගණිත, විද්‍යා පන්තියේ සිසුන් පන්තිය පිරිසිදු කර නොතිබූ බවත්, නැවත තමන් පන්තිය වෙත පැමිණෙන විට සිසුන් කිහිප දෙනෙකු පන්තිය පිරිසිදු කිරිම සඳහා දිවගිය බවත් එහිදි තමන්ට හසුවූ සිසුන් කිහිප දෙනෙකුට කෝටුවකින් පිටුපසට පහර කිහිපයක් ගැසූ බවත්, එම සිසුන් අතර පැමිණිලිකරුගේ දරුවාද සිටි බවත්, එවිට ඔහුටද පහරක් ගැසූ බවත්, සඳහන් කර ඇත. ඔහු එවිට විරෝධය දක්වා තමන්ට ඇඟිලි දිගු කරමින් බනින ලද බවත්, සිසුවාගේ මෙකී ක්‍රියා කලාපය දැක නැවත වරක් ඔහුට කෝටුවෙන් පහරක් ගැසීමට සූදානම් වූ විට ඔහු උණ බටයක් ගෙන තමන් දෙසට උණ බටය දිගුකර තමන්ට පහරදෙන්නට සැරසුණු බවත් සඳහන් කර ඇත.

ඒ අනුව තමන් මේ පිළිබඳව විදුහල්පතිවරයා වෙත පැමිණිලි කළ බවත්, අනතුරුව උමේෂගේ මව විදුහලට කැඳවීමට කටයුතු කළ අතර, එහිදි සිදුවූ වරද සම්බන්ධයෙන් වැද සමාව ගත් බවත්, උමේෂ සිසුවාගේ පියා අරලගංවිල පොලිසියේ සේවය කරන පොලිස් සැරයන්වරයකු බවත්, ඔවුන් විසින් අරලගංවිල පොලිසියට කරන ලද පැමිණිල්ලකට අනුව මේ පිළිබඳව විභාග කර පැමිණිල්ල පොළොන්නරුව මහේස්ත්‍රාත් අධිකරණය වෙත යොමු කොට ඇති බවත් දක්වා ඇත.

වගඋත්තරකරු වැඩිදුරටත් දන්වා ඇත්තේ, පාසලේදි ගුරුවරුන් වන තමන් විසින් සෑම විටම උත්සහ කරනු ලබන්නේ, දරුවන් නිවැරදි මාර්ගයට යොමු කර රටට වැඩදායී පුද්ගලයින් බවට පත්කිරීමට බව දෙමාපියන් විසින් තේරුම්ගත යුතු බවත්, එහිදි වැරදි සිදුකරන දරුවන් නිවැරදි මාර්ගයට ගැනීමටත්, අනෙක් සියළු දරුවන් එවැනි වැරදි නොකිරීමටත්, වැරදි කරන දරුවන්ට යම්කිසි දඬුවමක්දීම පාසලේදි සිදුවන බවත්ය.

වගඋත්තරකාර ඉන්දික කුමාර ඉඩමේගෙදර ගුරුවරයා කොමිසම වෙත වාර්ථාවක් යොමු කරමින් දන්වා ඇත්තේ, 2012.12.05 දින වාර විභාග ලකුණු හා උත්තරපත්‍ර ළමයින්ට දෙන දිනයක් වන බවත්, එදින තමන් කාර්යාලයේ සිටින විට ඩයස් මහතාට සිසුවකු පහරදීම සඳහා පැමිණි බවට හා එම සිසුවා බණ්ඩාර බවට දැනගත් බවත්, එහිදි බණ්ඩාර සිසුවාගෙන් ඩයස් යන ගුරුවරයාට පහරදෙන්න හැදුවාද යන්න විමසූ විට "ඔව සර් අත දික්වුණා" යනුවෙන් පැවසූ බවත්ය. ඒ අනුව අදාළ සිසුවාට අවවාද කිරීමක් පමණක් කළ බවත්, මෙම සිද්ධිය සම්බන්ධයෙන් පැමිණිලිකරු විසින් අරලගංවිල පොලිසිය වෙත කරන ලද පැමිණිල්ලක් අනුව පොළොන්නරුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් විභාගවෙමින් පවතින බවත් සඳහන් කර ඇත.

**විමර්ශණයේදි අනාවරණය වී ඇති කරුණු :-**

2012.12.05 වන දින දෙහිඅත්තකණ්ඩිය රෝහල් පොලිස් මුරපොලින් අරලගංවිල පොලිසිය වෙත ලද දුරකථන ඇමතුමක් අනුව පැමිණිලිකරුගේ පුතා වන ආර්.එම්. උමේෂ ආශක්ත බණ්ඩාර යන අයට සිදුකළ පහරදීම සම්බන්ධයෙන් අරලගංවිල පොලිසිය විමර්ශනයක් ආරම්භ කර ඇති බව අංක 580/2013 යටතේ 2013.02.15 දින කොමිසම වෙත වාර්තාවක් යොමු කරමින් අරලගංවිල පොලිසියේ ස්ථානාධිපති විසින් දන්වා ඇත.

විමර්ශනයේදි දෙහිඅත්තකණ්ඩිය රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලැබූ උමේෂ් යන අය පොළොන්නරුව මහ රෝහල වෙත යවා තිබූ බැවින් අංක 720/12 දරණ අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමය මඟින් පොළොන්නරුව මහ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරි වෙත යොමුකර ඇත.

එසේම පාසලේ සිසුවකුට ගුරුවරු තිදෙනෙකු විසින් පහරදී තුවාල සිදුකිරීම සම්බන්ධයෙන් අංක B 1261/2012 යටතේ ගරු අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇත.

**නිරීක්ෂණ හා නිගමනය :-**

පැමිණිලිකරු ප්‍රධාන කොටම තම පැමිණිල්ල මඟින් ප්‍රකාශ කර ඇත්තේ, 2012.12.05 වන දින තම පුතා වන උමේෂ් යන අයට ඉහත වගඋත්තරකරුවන් විසින් පහරදීමක් සිදුකර ඇති බවත්, මෙම වගඋත්තරකරුවන්ගේ ක්‍රියාව තුලින් දරුවාගේ මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවත්ය.

01 හා 03 යන වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුගේ දරුවාට පහරදීමක් සිදුකර නොමැති බවට ප්‍රකාශ කර ඇති අතර, 02 වන වගඋත්තරකරු උමේෂ බණ්ඩාරගේ පිටුපසට කෝටුවකින් පහරක් ගැසූ බව පිළිගෙන ඇත. එය ද්වේශ සහගත ලෙස වරදක් සිදුකිරීමේ චේතනාවෙන් සිදුකරන ලද ක්‍රියාවක් නොවන බවට ප්‍රකාශයක් කර ඇත.

පැමිණිලිකරු කොමිසම වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ල අනුව උමේෂ සිසුවාට වගඋත්තරකරුවන් පහරදී ඇති බව පැවසෙන්නේ 2012.12.05 දිනදීය. එමෙන්ම පහරදීම සම්බන්ධයෙන් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා දෙහිඅත්තකණ්ඩිය රෝහල වෙත ගොස් රෝහල්ගත වී ඇත්තේ 2015.12.08 දින බවද සඳහන් වේ. ඒ අනුව උමේෂ බණ්ඩාර සිසුවා පොළොන්නරුව මහ රෝහල වෙත 2012.12.09 වන දින මාරුවකට යවා ඇති බව නිරීක්ෂණය වන අතර, පොළොන්නරුව මහ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරි විසින් අධිකරණ වෛද්‍ය වාර්තාව ලබාදී ඇත.

අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාවේ මතය පහත පරිදි සටහන් කර ඇත.

According to the E NT (Ear, Nose and Throat) opinion, there was a perforation of the left ear-drum and it was completely healed at the review (after 3 weeks) with on hearing impairment.
තුවාල බරපතල නොවන තුවාල ලෙස වෛද්‍ය මතය සටහන් කර ඇත.

17/2005 හා 12/2016 දරණ පාසල තුළ විනය ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛනයන්හි සඳහන් වන්නේ පාසල තුළ දරුවන්ට ශාරීරික දඬුවමක් නොකළ යුතුය යන්න.
පැමිණිල්ලේ සඳහන් දරුවා සම්බන්ධයෙන් නිකුත් වී ඇති අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව ඔහු පාසලේදී ශාරීරික දඬුවමකට ලක්ව ඇති බව නිරීක්ෂණය වේ.

නිගමනය :-

ඒ අනුව වගඋත්තරකරුවන්ගේ ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාවේ හි සඳහන් මූලික අයිතිවාසිකම් පැමිණිලි පාර්ශවීය දරුවා සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බව පරික්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01. 1, 2 හා 3 වගඋත්තරකරුවන් සම්බන්ධව විනය ක්‍රියාමාර්ග ගැනීමට ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කටයුතු කළ යුතුය.

02. එසේම 17/2005 හා 12/2016 දරණ චක්‍රලේඛනය පිළිබඳව හා මූලික අයිතිවාසිකම් පිළිබඳ අදාළ කලාප පාසල් දැනුවත් කිරීමට ක්‍රියාමාර්ග ගැනීමටද ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පියවර ගත යුතුය.

2019.10.31 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත: ලේකම්, - ඉහත නිර්දේශ අනුව පියවර ගැනීමට
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/